ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**ඉන්දීය මුදල් අමාත්‍යාංශයේ දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේ**

ඉන්දීය රජයේ මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කාර්ය සාධක බලකා (FATF) අංශයේ නිලධාරීන් ප්‍රමුඛ දූත පිරිසක් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ශ්‍රී ලංකා රජයේ අනෙකුත් අදාළ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැගීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා 2025 සැප්තැම්බර් 22-24 දිනවල ශ්‍රී ලංකා සංචාරයක නිරත වූහ. සෘජු බදු පිළිබඳ මධ්‍යම මණ්ඩලය, මධ්‍යම විමර්ශන කාර්යාංශය, මූල්‍ය බුද්ධි ඒකකය සහ FATF අංශයේ ප්‍රවීණයන් මෙම දූත පිරිසට අයත් විය.

2. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් සැපයීම වැළැක්වීමේ රාමු ශක්තිමත් කිරීම, මනා පිළිවෙත් බෙදා හදා ගැනීම සහ මෙම ක්ෂේත්‍රය තුළ දෙරට අතර වඩා ශක්තිමත් සහයෝගීතාවයන් උදෙසා වන අවස්ථා ගවේෂණය කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය.

3. සමාරම්භක සැසිය සඳහා කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම, මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ යන මහත්වරුන් සහ නීතිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා, පොලිස්පතිතුමා සහ අදාළ අමාත්‍යාංශයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී වූහ.

4. AML/CFT වගකීම්, අතථ්‍ය වත්කම් සේවා සම්පාදකයන් සඳහා නියාමන සහ මූල්‍ය ආයතන සඳහා අනුකූලතා රාමු වැනි කරුණු ආවරණය කරමින් අතථ්‍ය අන්තර්ක්‍රියා මාලාවක් ද මෙම වසර මුලදී පැවැත්විණ. එසේම, ද්විපාර්ශ්වික සහයෝගීතාවය ශක්තිමත් කිරීම, නියාමන සූදානම ඉහළ නැංවීම සහ ගෝලීය ප්‍රමිතීන් සමඟ සමපාත වීම සහතික කිරීමේ අරමුණින් තවත් අමතර අතථ්‍ය අන්තර්ක්‍රියා සහ දෙපාර්ශ්වයේම නියෝජිතයන්ගේ සංචාර රැසක් සිදු කෙරෙනු ඇත.

5. මෙම මුලපිරීම කලාපීය මූල්‍ය සුපිළිපන්භාවය සහ මතුවන අභියෝගයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ ප්‍රයත්නයන්ට දායකත්වය ලබා දෙමින් ධාරිතා ගොඩනැගීම සහ තාක්ෂණ සහය යන ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලංකාව සමඟ සමීපව කටයුතු කිරීම සඳහා ඉන්දියාවේ කැපවීම අවධාරණය කරයි.

****

**කොළඹ**
***2025* සැප්තැම්බර් *25***